# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලීසිය

### උප සේවා සහකාර පොලිස් අධිකාරි (පිරිමි / කාන්තා) (නීති නිලධාරි) තනතුර

ශ්‍රී ලංකා පොලිසියේ උප සේවා සහකාර පොලිස් අධිකාරි (පිරිමි / කාන්තා) (නීති නිලධාරි) තනතුරට තාවකාලික පදනම මත බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් **අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගැනීමේ කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06** යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2026.03.20 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. අයදුම්පත් යොමු කිරීම ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් වෙතොත් එය අයදුම්කරු/ අයදුම්කාරිය විසින් විඳදරා ගත යුතු ය.

04. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

05. මාසික දීමනා :-

මාසික දීමනා ගණනය කිරීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ප්‍රකාරව වැටුප් කේත SL- 1-2025 යටතේ සහකාර පොලිස් අධිකාරි තනතුරේ ආරම්භක මාසික වැටුප මත පදනම්ව ගණනය කරනු ලැබේ.

තව ද, මෙම නිලධරයන්ට මාසික දීමනාව ගණනය කිරීම පහත වගුව අනුව සිදු කරනු ලබයි.

| | *(2026) (මාසිකව රු.)* | *(2027) (මාසිකව රු.)* |
|---|---|---|
| මාසික දීමනාව | 74,438.00 | 82,150.00 |
| 22% දීමනාව | 16,376.36 | 18,073.00 |
| විශේෂ දීමනාව | 1,250.00 | 1,250.00 |
| ජීවන වියදම් දීමනාව | 17,800.00 | 17,800.00 |
| ආහාර හා නවාතැන් දීමනාව | 34,800.00 | 34,800.00 |

| | | *(2026) (මාසිකව රු.)* | *(2027) (මාසිකව රු.)* |
|---|---|---|---|
| දුෂ්කර දීමනාව | | 2,000.00 | 2,000.00 |
| දුරකථන දීමනාව | ස්ථාවර | 3,000.00 | 3,000.00 |
| | ජංගම | 750.00 | 750.00 |
| විධායක දීමනාව | | 3,000.00 | 3,000.00 |

සහකාර පොලිස් අධිකාරි නීති නිලධරයෙකුට නිල වාහනය ලබා ගැනීමට හිමිකම් ඇත. නිල වාහනය වෙනුවට පුද්ගලික වාහනයක් භාවිතා කරන්නේ නම් මසකට රු. 50,000 ක දීමනාවක් හා ඉන්ධන ලීටර් 250 ක වටිනාකමට සමාන දීමනාවක් ලබා ගැනීමට හිමිකම් ඇත. **මෙම දීමනා වලට අමතරව තනතුරට අදාළ පොලිස්** නිලධරයන්ට ලැබෙන සුහසාධන සහ වෛද්‍ය පහසුකම් ලබා ගැනීමට හිමිකම් ඇත.

❖ මෙම තනතුරට බඳවා ගැනීම තාවකාලික පදනම මත සිදු කරන බවත්, බඳවා ගැනීමෙන් පසු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක විය යුතු අතර, ඊට ගෙවිය යුතු දායක මුදල් විටින් විට ප්‍රකාශයට පත්කරනු ලබන ආකාරයට අයකරගනු ලැබේ.

6. **අවශ්‍ය මූලික සුදුසුකම් :-**

**වයස් සීමාව :**

අවම වයස - 25
උපරිම වයස - 45

**අධ්‍යාපන සුදුසුකම් :**

**ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.**

**වෘත්තීය පළපුරුද්ද :**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු කාලයක් අපරාධ අධිකරණයක නීතිඥයකු වශයෙන් සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු, නීති ක්ෂේත්‍රයේ වසර 03 කට නොඅඩු කාලයක් අවම වශයෙන් පහත දැක්වෙන කාර්යයන් 02 ක් සම්බන්ධයෙන්වත්, අදාළ පළපුරුද්ද ලබා තිබීම.

i. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු,
ii. ගිවිසුම් සම්බන්ධ නෛතික කටයුතු,
iii. විවිධ අනපනත්, චක්‍රලේඛ, රෙගුලාසිවලට අදාළ නීතිමය ලියකියවිලි සම්පාදන කටයුතු,
iv. විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති සම්බන්ධ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු.

**7. වෙනත් සුදුසුකම්**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරුවන්/අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලීසිය අපේක්ෂිත ආකාරයට විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

❖ මේ සඳහා විවාහක / අවිවාහක ඕනෑම අයෙකුට අයදුම් කළ හැක.

**8. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

බඳවා ගැනීම සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමට **යෝග්‍යතා ඇගයීමේ** සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. එහි දී පහත සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | | *උපරිමය ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | 25 |
| i. නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 10 | |
| ii. නීතිවේදී උපාධිය | 08 | |
| iii. වෙනත් පශ්චාත් උපාධි | 06 | |
| iv. වෙනත් උපාධි | 04 | |
| v. උසස් ඩිප්ලෝමා / ඩිප්ලෝමා/ පාඨමාලා | 02 | |
| **සටහන 01** - iii, iv, v උපරිම පාඨමාලා 02 ක් සඳහා සලකා බැලේ.<br>**සටහන 02** – i සිට iv දක්වා සුදුසුකම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයකින් නිකුත් කළ උපාධි සහතික සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br>**සටහන 03** – v සඳහා SLQF 4 හෝ 3 මට්ටමේ සහතිකවලට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |
| 2. අතිරේක වෘත්තීය පළපුරුද්ද :<br><br>මූලික සුදුසුකම් ලබන කාලය හැර අනෙකුත් කාලය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | | 35 |
| i. නීතිඥයෙකු වශයෙන් වෘත්තීය පළපුරුද්ද (මාස 06 කට ලකුණු 01 හා වසරකට ලකුණු 02 බැගින්) | 20 | |
| ii. නොතාරිස් වරයෙකු වශයෙන් වෘත්තීය පළපුරුද්ද (මාස 06 කට ලකුණු 0.5 හා වසරකට ලකුණු 01 බැගින්) | 10 | |
| iii. නීතිඥයෙකු වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවලට පෙනී සිටීම | 08 | |
| iv. නීතිඥයෙකු වශයෙන් අභියාචනාධිකරණ නඩුවලට පෙනී සිටීම | 06 | |
| v. නීතිඥයෙකු වශයෙන් මහාධිකරණ නඩුවලට පෙනී සිටීම | 04 | |
| vi. නීතිඥයෙකු වශයෙන් දිසා අධිකරණ නඩුවලට පෙනී සිටීම | 02 | |
| (ඉහත සුදුසුකම් සඳහා පිළිගත හැකි ලේඛන මගින් සනාථ කළ යුතුය.) | | |

| ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | | උපරිමය ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 3. භාෂා හැකියාව : | | 15 |
| i. මාධ්‍ය භාෂාවට අමතරව අනෙක් ජාතික භාෂාවට | | |
| a. ඩිප්ලෝමා | 08 | |
| b. උසස් සහතිකපත් | 06 | |
| c. සහතිකපත් | 04 | |
| d. උසස් පෙළ | 02 | |
| e. සාමාන්‍ය පෙළ | 01 | |
| ii. ඉංග්‍රීසි භාෂාව | | |
| a. ඩිප්ලෝමා | 08 | |
| b. උසස් සහතිකපත් | 06 | |
| c. සහතිකපත් | 04 | |
| d. උසස් පෙළ | 02 | |
| (එක් භාෂාවක උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | | |
| 4. තොරතුරු තාක්ෂණය : | | 10 |
| i. ඩිප්ලෝමා (මාස 06 කට නොඅඩු) | 10 | |
| ii. උසස් සහතිකපත් (මාස 03 කට නොඅඩු) | 07 | |
| iii. සහතිකපත් (මාසයකට නොඅඩු) | 05 | |
| (කාල සීමාව සඳහන් නොවුවද SLQF සුදුසුකම අනුව ලකුණු ලබා දෙනු ලැබේ.) | | |
| 5. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාවය | | 15 |
| **එකතුව** | | **100** |

8.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා:- පොලිස්පති හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයෙකු.

8.2. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව අනුව, සකස් කරන ලද ප්‍රමුඛතා ලේඛනය මත පුරප්පාඩු සංඛ්‍යාවට අනුව ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් පසුබිම් පරීක්ෂණයට යොමු කරනු ලැබේ.

8.3. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.

**9. පසුබිම් පරීක්ෂණය**

9.1. ඉහත 8.2 අනුව යොමු කරනු ලබන අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා පසුබිම් පරීක්ෂණය පවත්වනු ලබයි.

9.2. අයදුම්කරුගේ / අයදුම්කාරියගේ යහපත් චරිතය තහවුරු කරගැනීම සඳහා ඔහු / ඇය හා ඔහුගේ / ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු/ ඇය සමීපව ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය, හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් පරීක්ෂණ වාර්තා සහිත අයදුම්කරුවන් / අයදුම්කාරියන් බඳවාගනු නොලැබේ.

***සටහන :-*** **සමීප ඥාතීන් සම්බන්ධයෙන් අපරාධ වාර්තා කිසිවක් නොතිබිය යුතුය. සමීප ඥාතීන් යනු අයදුම්කරු / අයදුම්කාරියගේ මව, පියා, භාරකරුවන්, සහෝදර සහෝදරියන් සහ විවාහක නම් කලත්‍රයන් ද, අයදුම්කරු / අයදුම්කාරිය විවාහක නම් කාලත්‍රයන්, කාලත්‍රයන්ගේ සහෝදර සහෝදරියන් සමීප ඥාතීන් ලෙස සලකනු ලැබේ.**

9.3 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් / අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු / ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඕනෑම අවස්ථාවක දී පත්වීම අවලංගු කරනු ලැබේ.

**10. වෛද්‍ය පරීක්ෂණය**

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ අධ්‍යක්ෂ/ වෛද්‍ය, ඇතුළු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. තවද මෙහි දී අයදුම්කරුවන් / අයදුම්කාරියන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතා පරීක්ෂණයකට ද භාජනය කරනු ලැබේ. අධ්‍යක්ෂ/ වෛද්‍ය, විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සංඛ්‍යා 169 පෝරමය යටතේ ඉදිරිපත් කළ යුතු අතර අයදුම්කරු/ අයදුම්කාරිය විෂ මත්ද්‍රව්‍යා භාවිතා කිරීම සම්බන්ධ වාර්තාවක් ද ඇතුළත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණය අසමත් වන අයදුම්කරුවන්ට සහ අයදුම්කාරියන්ට අභියාචනා ඉදිරිපත් කළ නොහැක.

**11. සේවා කොන්දේසි**

**i.** බඳවා ගන්නා නීතිඥවරුන් උපරිම වසර 05 කාලසීමාවකට යටත්ව හඳුනාගත් නිශ්චිත කාර්යයන්වල රාජකාරී යොදවා ගනු ලබයි.

ii. එකී කාර්යයන් අවසන්වූ පසු හෝ පත්වීමේ කාලය අවසන් වූ පසු තාවකාලික පත්වීම අවසන් කරනු ලැබේ.

iii. ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, ජාතික පොලිස් කොමිෂන් සභා, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ , පොලිස් නියෝග, ශ්‍රී ලංකා පොලිසියේ අත්පොත්වල සහ උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ තත්කාලයේ බලපවත්නා වෙනත් විධි විධානවලටද යටත් විය යුතු ය.

iv. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29, 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි, තත්කාලයේ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පනවනු ලබන රීති හා කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අදාළ වේ.

v. මෙම නිලධරයන් ශ්‍රේෂ්ඨාධිකරණ රීති මගින් අනුමත කර ඇති නීතිඥ ඇඳුමින් සැරසී රාජකාරී කරනු ලැබිය යුතු ය.

**12. පුහුණුව.**

පොලිස්පති විසින් නියම කරනු ලබන කාලයක් සඳහා සේවාරම්භක පුහුණුවකට සහභාගී විය යුතු ය.

13. අයදුම්කරුවන්/අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. ( මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය)

(*අ*) උප්පැන්න සහතිකය;

(*ආ*) ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්;

(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික;

(*ඈ*) නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමේ සහතිකය;

(*ඉ*) වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික;

(*ඊ*) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික;

(*උ*) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන);

(*ඌ*) ඡේද 08 හි යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ යටතේ ලකුණු ලබා ගැනීමට ඉදිරිපත් කිරීමට නියමිත අනෙකුත් සියලුම සහතිකවල පිටපත්.

14. අයදුම්කරුවන් / අයදුම්කාරියන් විසින් පරිගණක යතුරු ලියනය කරන ලද අයදුම්පත අඟල් 11 x 8 (A4) ප්‍රමාණයේ කඩදාසිවල සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව භාර නොදිය යුතු ය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට / අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන* **-** පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට / අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ප්‍රියන්ත වීරසූරිය
පොලිස්පති.